// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2070/10 – 2018 මැයි 09 වැනි බදාදා – 2018.05.09

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම්, පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, ඒවා ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය, ගයන්ත කරුණාතිලක වන මම, මෙයින් ප්‍රකාශ කරමි.

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, මාවතගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ගන්දහය කෝරළේ සුළු කොට්ඨාසයේ, අංක 699, මඩව ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, පිලැස්ස ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක කේයු/එම්ඩබ්ලිව්ටී/2017/299 හා 2017.09.14 දිනැති ප්‍රගමන අනුරේඛනයේ සවිස්තරව දැක්වෙන පහත සඳහන් නම්වලින් සහ ප්‍රමාණයන්ගෙන් යුත් ඉඩම් කැබලිවලට මායිම්:

01. **කැබලි අක්ෂර 'ඒ' – ඩේසිමවුන්ට්වත්ත – ප්‍රමාණය: හෙක්. 0.0405 ක් පමණ**

උතුරට: හිමිකම් කියන අය සොයාගත නොහැකි ඩේසිමවුන්ට්වත්ත; නැගෙනහිරට: මාර්ගය; දකුණට: කැබලි අක්ෂර බී; බටහිරට: කේ. ඒ. පුෂ්පකාන්ති හිමිකම් කියන සමගි උයන.

02. **කැබලි අක්ෂර 'බී' – ඩේසිමවුන්ට්වත්ත – ප්‍රමාණය: හෙක්. 0.0391 ක් පමණ**

උතුරට: කැබලි අක්ෂර ඒ; නැගෙනහිරට: මාර්ගය; දකුණට: ඒ. ජී. ප්‍රියන්ත හිමිකම් කියන ඩේසිමවුන්ට්වත්ත; බටහිරට: කේ. ඒ. පුෂ්පකාන්ති හිමිකම් කියන සමගි උයන.

ගයන්ත කරුණාතිලක,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය.

මගේ අංකය: 4-3/9/2017/ඩබ්ලිව්එස්/69.
2018 පෙබරවාරි මස 14 වැනි දින,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය,
''මිහිකත මැදුර'',
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

05 – 586